# අපරාධකාරී චර්යාව කෙරෙහි බලපාන සාධකයන්හි සමාජ විද්‍යාත්මක පසුබිම පිළිබඳ විමර්ශනයක්

ඩබ්.ඒ.කේ.යූ.ඒ. ලක්මාලි*

**සංක්ෂේපය**

අපරාධකාරී හැසිරීම ලොව ඕනෑම තැනක සිදු වන ක්‍රියාවකි. ප්‍රමාණාත්මක වශයෙන් අපරාධකාරී හැසිරීම් බහුල වීම සංඛ්‍යාත්මක තොරතුරු වලින් හඳුනා ගත හැක. මේ නිසා අපරාධ ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත් ව ඇත. අපරාධ ඇති වීමට බලපානු ලබන හේතු සම්බන්ධයෙන් විමසීමේ දී න්‍යායාත්මක මතවාද වැදගත් වේ. අපරාධකාරී චර්යාව හඳුනා ගැනීමට සමාජ විද්‍යාත්මක න්‍යායන්ගේ බලපෑම පිළිබද ව විමර්ශනයක් මෙම ලිපියෙහි අන්තර්ගත වේ.

**හැඳින්වීම**

සමාජය තුළ පවතින ධර්මතා, අගනාකම් බිඳ දමමින් සමාජ විරෝධි අන්දමින් කටයුතු කිරිම සමාජමය දෘෂ්ටියෙන් අපරාධකාරි චර්යාවන් වේ. පවතින නීතියට අනුගත නොවී නීතිවිරෝධි අන්දමින් කටයුතු කිරිම අපරාධකාරි චර්යාවන් ලෙස නීතිය තුළින් අර්ථ දක්වා ඇත. අපරාධ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරිමේ දි අපරාධකාරි චර්යාවන් ඇති විමට බලපෑම් කරනු ලබන විවිධ න්‍යායාත්මක අදහස් ඉදිරිපත් වි ඇත. අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි අපරාධකාරි චර්යාව අධ්‍යයනය කිරිමට ගොඩ නගා ගෙන ඇති න්‍යායන් පවති. ඒ අතර, ජීව විද්‍යාත්මක න්‍යාය (Biological Theory), මනෝ විද්‍යාත්මක න්‍යාය (Psychological Theory), පරිසරාත්මක න්‍යාය (Ecological Theory), ගණිතමය න්‍යාය, රැඩිකල්වාදි න්‍යාය, ඝට්ටනවාදි න්‍යාය, වැදගත් වේ. මෙහිදි න්‍යායන් අධ්‍යයනය කිරිම මඟින් අපරාධකාරි චර්යාව, අපරාධ හා පුද්ගලයා අතර සම්බන්ධතාව ආදි කරුනු පිළිබඳ අවබෝධය ලබා ගත හැකි අතර මෙම ලිපිය තුළින් අපරාධකාරී චර්යාව කෙරෙහි සමාජ විද්‍යාත්මක න්‍යායන් තුළ අධ්‍යයනයට ලක් කිරිම මෙහිදි සිදු කර ඇත. මෙහිදි සමාජ විද්‍යාත්මක න්‍යායන් වන අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය (Theory of Differential Association), අනෝමීය න්‍යාය (Anomic Theory), ලේබල් කිරිමේ න්‍යාය (Lebelling Theory) යන න්‍යායන් පිළිබඳ විමර්ශනයක් මෙහි ඇතුළත් වේ.

**අපරාධකාරී චර්යාව පිළිබඳ අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය**

අපරාධකාරි චර්යාව පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යාය හඳුන්වා දුන් ප්‍රථම සමාජ විද්‍යාඥයා එඩ්වින් එච්. සදර්ලන්ඩ් (Edwin H. Sutherland) වැදගත් වේ. මේ පිළිබඳ අධ්‍යයනය

* *තාවකාලික කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, asankalakmali25@gmail.com*

කිරිමේදි අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය (Theory of Differential Association) වැදගත් වේ. 1939 දි රචනා කරන ලද The Principle of Criminology ග්‍රන්ථය තුළින් හඳුන්වා දි ඇත.

පුද්ගලයන් අතර පවතින අන්තර් ආශ්‍රය අපරාධ සිදු විමට බලපානු ලබයි. මෙහිදි පුද්ගලයන් එකිනෙකා සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ තම අදහස් හුවමාරු කර ගනිමින් සහසම්බන්ධතා පැවැත්විමේදි ඉතා ඉක්මනින් අපරාධකාරි චරියාවන් වලට පෙළඹෙන සදර්ලන්ඩ් ප්‍රධාන කරුණු 09 ක් තුළින් පෙන්වා දි ඇත.

- අපරාධකාරි චර්යාව ඉගෙන ගත් චර්යාවක් වේ. මේ තුළින් පැහැදිලි වන්නේ අපරාධකාරි චර්යාව උපතින් හෝ සහංයෙන් ලැබෙන දෙයක් නොවන බවයි. අපරාධකාරි චර්යාව පිළිබඳව අවබෝධයක් දැනුමක් නොමැතිව අපරාධකාරී චර්යාව නිර්මාණය කොට තම චර්යා රටාවට එකතු කර ගත නොහැක.
- අපරාධකාරි චර්යාව ගොඩ නැගෙන්නේ සන්නිවේදන ක්‍රියාවලිය සහ පුද්ගලයන් අතර සිදුවන අන්තර් ක්‍රියාවෙන් ලැබෙන ඉගෙනුම තුළිනි. එම සන්නිවේදනය බොහෝ අවස්ථාවල වාචික වුවත් සමහර අවස්ථා වල අභිනය මගින් සන්නිවේදනය කර ඇත.
- ඉතාම සමීප පුද්ගල සමූහ තුළින් අපරාධකාරි චර්යාව ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස සිදුවේ. නිශේධනාත්මකව මෙයින් අදහස් කරනු ලබන්නේ සන්නිවේදනයේ අන්තර් පුද්ගල ආයතන මඟින් චිත්‍රපට, රූපවාහිනි ප්‍රවෘත්ති,නාට්‍ය වැනි අපෞද්ගලික ආයතන අතර ඇතිවන සන්නිවේදනය අපරාධකාරි චර්යාව වර්ධනය විමට බලපෑමක් වන බවයි.
- අපරාධකාරි චර්යාව ඉගෙන ගත් දෙයක් වු විට එම ඉගෙනිමට අයත් වන මූලික ස්වරූප දෙකක් වේ. එනම් අපරාධ ඇති විමේ ශිල්පීය ක්‍රම පිළිබඳ ඉගෙනිම හා අපරාධ පිළිබඳ අභිප්‍රේරණයන් යුක්ති සහගත කිරීම ද සහ ඒවායේ ඉලක්ක්යන් තේරුම් ගැනීම මෙහිදී දැක ගත හැක.
- අපරාධකාරී චර්යාව යොමු වන්නේ නීතියට ගරු නිරිමට ඇති නිර්වචන ගණනාවකට වඩා නීතිය නොසලකා හැරීම පිළිබඳ පවතින අසහස් හේතුවෙනි. සමහර සමාජවල පුද්ගලයකු තවත් පුද්ගලයකු හා සම්බන්ධ වි සිටින විට එහිදි කිසියම් අපරාධයක් කිරිමට පුද්ගලයා යොමු කරවන නෛතික වරදවල් සුවිශේෂි විය හැකිය.
- පුද්ගලයකු අපරාධකාරී චර්යාවන්ට නැඹුරු වන්නේ ඉගෙනුම තුළින් ලබන තොරතුරු අනුවයි. නීතිය කැඩිටමන් ලැබෙන වාසි සහගත නීතිය රැකීමෙන් ලැබෙන වාසි සහගත බව වැඩි නම් නීතිය උල්ලංඝන කීරීම සුදුසු යැයි සිතයි. අන් අය සමඟ පවත්වනු ලබන අයහපත් සම්බන්ධතා හේතුවෙන් මෙකි තත්ත්වය සිදු වේ.
- කෙනෙකු අන්තර් ආශ්‍රය සිදු කීරිමේ දි බලපාන සාධක 04ක් පවති. සංඛ්‍යානය (වාර ගණන), රදා පවතිනිනා වු කාලය, ප්‍රමුඛත්වය, දැඩි බව වේ. අන්තර් ආශ්‍රය නීති ගරුක ක්‍රියාවක් මෙන්ම නීති විරෝධි චර්යාවන් ලෙස මෙම කරුණු හතර ඔස්සේ සකස් වේ.
- අපරාධකාරි චර්යාව ඉගෙනිමේ ක්‍රියාවලිය අපරාධකාරි හෝ අපරාධ විරෝධි රටාවට ඇති යන්ත්‍රණයට සමාන වේ. අපරාධකාරි චර්යාව අනුකරණ ක්‍රියාවට පමණක් සිදු නොවේ.

- අපරාධකාරි චර්යාව සාමාන්‍ය අවශ්‍යතා හා අගනාකම් මඟින් විස්තර කිරිම හා අගනාකම් හා අවශ්‍යතා සපුරා ගැනීමට අපරාධ සිදු කරනු ලබයි.

මානව චර්යාව හැඩ ගැසෙන ගතික සාධකය පරිසරාත්මක අත්දැකිම් යන අදහස මානව විද්‍යාත්මක නිරික්ෂණයෙන් අවබෝධ වන පොදු ප්‍රකාශනයකි. මිනිසාගේ ක්‍රියාකාරකම් තමා අවට ජිවන සන්දර්භය වෙතට පවතින අනුකලනය (Integration) හා ඒකලනය (Isolation) මඟින් පැන නඟි. දැනුම අවබෝධය මෙන්ම අත්දැකිම් ද පාදක කොට ගෙන අනුවර්තනය විමේ ක්‍රියාවලියේ දි මුහුණ දෙන ගැටළු සහ ගැටුම් ඉදිරියේදි ආවේගකාරි හැසිරීම් රටාවක් ප්‍රදර්ශනය කරනු ලබයි (අමරසේකර,2012:93).

මිනිසා ජිවත් වන සමාජයේ අන්තර් සබඳතා පැවැත්විම පුද්ගල පැවැත්මට වැදගත් වේ. ළදරුවකු ලෙස සමාජයට පිවිසෙන පුද්ගලයා සමාජානුයෝජනය විමේදි පුද්ගල ජිවිතයට බොහෝ දේ ඉගෙනිම සිදු කරයි. හොඳ, නරක හඳුනා ගනිමින් කටයුතු කිරිමට ඉගෙනිම තුළින් හැකි වේ. අන්තර් සබඳතා වලදි සනින්වේදන ක්‍රියාවලිය වැදගත් වේ. සදර්ලන්ඩ් දක්වන අන්දමට පුද්ගලයන් අන්තර් සබඳතා පවත්වනු ලබන සමිප ඇසුරු කිරිම් තුළින් අපරාධකාරි චර්යාවන් ඉගෙනිම සිදු විය හැකි බවයි. එමෙන් ම වර්තමානයේ ප්‍රබල සන්නිවේදන මාධ්‍යන් වන රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් ආදි සන්නිවේදන මාධ්‍යයන් පුද්ගලයන්ට නව ඉගෙනුම් ප්‍රවේශයකි. නමුත් මෙවැනි මාධ්‍යයන් තුළින් ද අපරාධකාරි චර්යාවන් ඉගෙනිමට පෙළඹෙන බව සදර්ලන්ඩ් අන්තර් ආශ්‍රය න්‍යාය විග්‍රහ කර ඇත. සදර්ලන්ඩ් දක්වන අන්දමට අපරාධ ඉගෙනිමට අයත් වන මූලික ස්වරූප දෙක තුළ අපරාධ පිළිබඳ ශිල්පීය ක්‍රම ඉගෙනිම වැදගත් වේ. මේ යටතේ නුතනය තුල අසන්නට දකින්නට ලැබෙන අපරාධ සිද්ධි, ප්‍රවෘත්ති, චිත්‍රපට ආදි දේ තුළින් අපරාධකාරි චර්යාවන්ට අවශ්‍ය ශිල්පීය දැනුම ලබා ගැනිමට පෙලඹිය හැකිය. එමෙන් ම අපරාධ පිළිබඳ ආකල්ප චේතනා ඇති විම ද සිදු විය හැක. සදර්ලන්ඩ් ඉදිරිපත් කරනු ලබන අන්තර් ආශ්‍රය න්‍යාය තුළ අපරාධකාරි චර්යාව ඉගෙනගත් චර්යාවක් ලෙස තවදුරටත් විග්‍රහ කර ඇත.

S.Gluck නම් අපරාධ විද්‍යාඥයා විසින් 1950 දි බාලාපචාරය අනාවරණය කිරිමට කරනු ලැබු පර්යේෂණයෙන් පෙන්වා දි ඇත්තේ අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් පිරිසෙන් 56 ක ප්‍රමාණය අපචාරි ළමුන් අතරින් 0.3 ක් පමණක් කල්ලි කණ්ඩායම් තුළින් එම ක්‍රියාවන්ට යොමු වු අය බවත්ය (ජයතුංග,2010:45). පුද්ගලයා සමාජය වෙත විවරණය විමේදි අනෙකා සමඟ ගොඩ නගා ගන්නා ගනුදෙනුවේ ස්වරූපය මත අපගාමිත්වය තීරණය වේ (ජයවීර,2008:31). අපරාධ චර්යාවෙහි යෙදිමට අදාල ආකල්ප ජනනය කර ගැනිමටත් අපරාධ කිරිමට අදාළ තාක්ෂණය උගැන්මටත් එකී සමීප ඇසුර හේතු වේ. අපරාධකාරි චර්යාව උගන්නේ ද වෙනත් ඕනෑම චර්යාවක් ඉගෙන ගන්නා ආකාරයටමය. අපරාධකාරි චර්යාව පිළිබඳ ඉගෙනිම සමාජයට ප්‍රබල ලෙස බලපාන බව සදර්ලන්ඩ් අදහස් දක්වා ඇත.

ග්‍රේබියල් ටාඩ් (Gabriel Tared) ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයකු වන අතර ඔහු අපරාධ සමාජ ප්‍රපංචයක් ලෙස හඳුන්වා දි ඇත. ඔහුට අනුව අපරාධයකට මිනිසා පෙළඹෙන්නේ

අනුකරණය (Imitation) හේතු කොට ගෙන බවයි (ජයතුංග,2010:46). යම් පිරිසක් කරනු එම ආකාරයෙන් ම සිදු කිරීම අනුකරණය වේ. මේ අනුව අපරාධකාරී චර්යාවන් ද අනුකරණය මඟින් ගොඩ නැගෙන බව තවදුරටත් දක්වා ඇත.

මේ අනුව අපරාධකාරී චර්යාව පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යායන් අතර සදර්ලන්ඩ් ඉදිරිපත් කරන ලද අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය ප්‍රධාන තැනක් ගනු ලැබුවද ඒ සම්බන්ධයෙන් විවිධ විවේචන පවති.

**අපරාධකාරී චර්යාව පිළිබඳ අනෝමීය න්‍යාය**

සමාජය විසින් අනුමත කරනු ලබන ධර්මතා අගනාකම් විනාශ වී එම සමාජය ධර්මතා විරහිත, සමාජ විසංවිධානකාරී ස්වභාවයට පත් වීම අනෝමීය තත්ත්වයකි. සමාජය කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් වෙනස්වීම් වලට ලක් වීමෙන් සමාජය තුළ සම්මත ධර්මතා අගනාකම් වෙනස් වී විසංවිධානකාරී තත්ත්වයට පත් වේ. අනෝමීය සිද්ධාන්තය පිළිබඳ අදහස් ඉදිරිපත් කරනු ලබන්නේ එමිල් ඩුර්කයිම් නම් ප්‍රංශ සමාජ විද්‍යාඥයා විසිනි. ඔහු විසින් සියදිවි නසා ගැනීම සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ තුළ අනෝමීයත්වය පිළිබඳ අදහස් දක්වා ඇත.

යම් සමාජයක පිළිගත් ධර්මතා, අගනාකම් විනාශ වීමේදී එවැනි සමාජයක සිටින පුද්ගලයෝ අපරාධ වැනි දූෂිත ක්‍රියාවන් හි නියැලීමට බියක් නොදක්වති. එම තත්ත්වය හේතු කොට ගෙන විසංවිධානකාරී සමාජයක අපරාධ වැඩි වන බව සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇත. එමිල් ඩුර්කයිම් දක්වන ආකාරයට අපරාධ වර්ධනය වීම අනෝමීය තත්ත්වය හෙවත් ධර්මතා විරහිත බව, නවීකරණය සමඟ සිදු වන සමාජ වෙනස් වීම තුළින් සිදු වන බවයි (ජයතුංග,2010:48).

ඩුර්කයිම්ගේ අනෝමීය සිද්ධාන්තය ඉදිරියට ගෙන යනු ලබන්නෙකු ලෙස ඇමරිකානු ජාතික රොබට් කේ. මර්ටන් දැක්විය හැකිය. මර්ටන් විසින් අනෝමීයත්වය පිළිබඳ ඩුර්කයිම්ගේ විශ්ලේෂණය තවදුරටත් විධිමත් ලෙස පුළුල් කරනු ලැබිය. කිසියම් සංස්කෘතියක ඇති අභිලාෂයන් ඉටු කර ගැනීම සඳහා අනුමත කොට ඇති මාධ්‍යයන් අතර ඇති පරතරය අපගාමීත්වයට හේතු වන බව මර්ටන් පෙන්වා දෙනු ලැබිය. ඇමරිකානු සමාජයේ ධනය හා සම්බන්ධයෙන් ස්ථාපනය වී ඇති ආකල්ප අතර පවතින ගැටුම ඒ සඳහා නිදර්ශන ලෙස මර්ටන් ඉදිරිපත් කරයි. මුල්‍යයමය වශයෙන් යම් කිසිවෙකු හට අත්පත් තර ගත හැකි සාර්ථකත්වයට සාපේක්ෂ ව ඇමරිකානුවන් සතුටට පත් වන්නේය (ජයසිංහ,2013:314). මර්ටන් විසින් සමාජ න්‍යාය සහ සමාජ ව්‍යුහය Social Theory and Social Structure කෘතිය තුළ අනෝමීයත්වය න්‍යායක් වශයෙන් ඉදිරිපත් කර ඇත.

මර්ටන්ට අනුව ඇමරිකානු සමාජයේ සිදුවන සමාජ අපචාරයන් වැඩි ප්‍රමාණයක් මෙම අනෝමිය න්‍යායට අනුව විග්‍රහ කළ හැකි වේ. ඔහු වැඩිදුරටත් පෙන්වා දෙන අන්දමට සමාජ හා සංස්කෘතික ව්‍යුහයේ මූලිකාංග දෙකක් හඳුනා ගත හැකි වේ. පලමුව සංස්කෘතික වශයෙන් නිර්වචනය කරන ලද අරමුණු වලින් පුද්ගලයින් මනා ක්‍රියාකාරිත්වයකට

දිරිගන්වනු ලබයි. දෙවනුව සමාජ ව්‍යුහය නියෝග පැනවීම සහ පාලනයන් ගොඩ නගමින් මෙම අරමුණු නිශ්චිත රටාවකට හෝ අර්ථයන් ඔස්සේ සංවිධානය කරනු ලබයි. අරමුණු වල අර්ථයන් සහ ආයතන ගත ධර්මතා විසින් මෙහෙයවනු ලබන අතර එය ස්වාධීනව ක්‍රියාත්මක විමට සලස්වනු ලබයි. මෙම මූලිකාංග සමාජයේ පැවැත්ම ගොඩ නඟන අතර අරමුණු සහ ධර්මතා ශක්තිමත් කරයි (කරුණාතිලක,1998:44).

1938 රොබර්ට් කේ. මර්ටන් (Robert K. Merton) අනෝමියත්වය පිළිබඳ තරමක් වෙනස් විග්‍රහයක් ඉදිරිපත් කළේය. සමාජ සංස්කෘතික ප්‍රතිනිර්මාණයක් වන මානව අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සමාජාපේක්ෂිත මාර්ගයක ගමන් ගනිමින් තම අරමුණු කරා ළඟා විය යුතු යැයි අපේක්ෂා කෙරේ. ජීවිතයට වටිනාකමක් එක් වන්නේ යමෙක් ජීවත් වන සංස්කෘතික වටපිටාවෙන් ප්‍රති නිර්මිත අගනාකම් තුළින්. මර්ටන්ගේ විග්‍රහය අනුව එම අගනාකම් සපුරා ගැනීමට ඇති මාර්ග සීමිතය. කෙතරම් මහන්සි වී වැඩ කළද සමාජ ක්‍රමය විසින් එකී සංස්කෘතික ඉලක්ක වෙත ළඟා වීම වලකා තිබේ. සෑම විටම සමාජයේ එක් පිරිසකට පරාජය අත් වේ. සමාජය තුළ පීඩනයක් නිර්මාණය වේ. අසමත් වන තැනැත්තාට දොස් පැවරෙන අතර සාර්ථක තැනැත්තා අගය කරයි. සංස්කෘතික අරමුණු හා ඒ කෙරෙහි ගමන් ගන්නා මාර්ග අතර සබඳතා ස්වරූප 5 කින් දක්වා තිබේ (ජයවීර,2008:33).

| සංස්කෘතික ඉලක්ක | සමාජ අනුමත මාර්ගය | ප්‍රතිඵලය |
|---|---|---|
| + | + | අනුකූලතාවය (Conformity) |
| + | - | නවීකරණය (Innovation) |
| - | - | යාතු කාර්මිකත්වය (Ritualism) |
| නව අරමුණු | නව මාර්ග අනුගමනය | විප්ලවය (Rebellion) |

අනුකූලතාවන් සහිත පුද්ගලයන් සංස්කෘතික ඉලක්කයන් මෙන්ම ගමන් මග ද පිළිගනී. නවීකරණය වූ පුද්ගලයන් සංස්කෘතික ඉලක්ක පිලිගත්ත ද සමාජ අනුමත මාර්ග පිළිනොගනී. යාතු කර්මයට අයත් පුද්ගලයන් ඉලක්කයක් නොමැතිව සාම්ප්‍රදායික ගමන් මඟ තුළ ම ගමන් ගනී. විප්ලවීය පුද්ගලයන් අලුත් අරමුණු හා නව මාර්ග අනුගමනය කරති. යාතු කාර්මිකත්වයට අයත් පුද්ගලයන් හා නවීකරණයට පත් පුද්ගලයන් තුළින් අපරාධකාරී අනෝමියත්වයක් දක්නට ලැබෙන බව විග්‍රහ කරනු ලබයි.

ඇලගර් (Horatio Alger) විසින් කරන ලද පර්යේෂණ තුළින් අවධාරණය කරනු ලබන්නේ ඇමරිකානු ජනතාව ධනවත්භාවයට පත් වන්නේ ඔවුන්ගේ උරුමයෙන් කොටසක් වූ වාසනාවේ හා ධෛර්යයේ ප්‍රතිඵලයක් ලෙස බවයි. ඇමරිකානු ආකල්පයට අනුව ධන සම්පත් සාධනය යනු සංස්කෘතිමය ඉලක්කයකි. ඉහළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගෞරවාන්විත ව්‍යාපාර කටයුතු වල නිරත වීම සම්මත මාධ්‍යයන් වේ (ජයසිංහ,2013:314). නමුත් සම්මත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බාධක පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයා තුළ පසුතැවිල්ලක් ඉච්ඡාභංගත්වයක් ඇති විය හැක. ඒ නිසා තම අරමුණු සාධනය කර ගැනීමට අසම්මත අපගාමී ක්‍රියාමාර්ග යොදා ගනී.

සංස්කෘතික ප්‍රතිමාන අතර ඇතිවන ගැටුම් වල ප්‍රතිඵලයක් ලෙස අපගාමීත්වයක් සමාජ ව්‍යාකූලත්වයක් හට ගන්නා බව තොස්ටන් සෙලින් (Thorten Sellin) පෙන්වා දී ඇත. කිසියම් පුද්ගලයකු උප සංස්කෘතියක සාමාජිකයකු ලෙස හඳුනා ගත් පසු ඔහු අනුගමනය කරන ප්‍රතිමාන හා මහා සංස්කෘතියට අයත් ප්‍රතිමාන අතර ගැටුමක් ඇති වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අපගාමී සමාජ පරිසරයක් නිර්මාණය වන බව සෙලින් හා මිලර් පෙන්වා දෙනු ලැබේ (ජයසිංහ,2013:310).

වර්තමාන සමාජ වල අපරාධ වර්ධනය ශීඝ්‍ර වූවකි. තාක්ෂණික දියුණුවක් සමඟ මිනිසුන් මුදල අරමුණු කොට ගෙන කටයුතු කිරීම නිසා ධර්මතා අගනාකම් බිඳ වැටුනු සංස්කෘතික සාරධර්ම පිරිහුණු සමාජ වටපිටාවක් නිර්මාණය වී ඇත. ස්ත්‍රී දූෂණ, මිනීමැරුම්, මංකොල්ලකෑම්, සියදිවිනසා ගැනීම් සමාජය තුළ බහුල වීමට විසංවිධානකාරී, සමාජ අගනාකම් බිඳ වැටුණු සමාජ තත්ත්වය හේතු වී ඇති බව දැක්විය හැකිය.

**අපරාධකාරී චර්යාව පිළිබඳ ලේබල් කිරීමේ න්‍යාය**

අපරාධකාරී චර්යාව පිළිබඳ අධ්‍යයනය කිරීමට සමාජ විද්‍යාත්මක න්‍යායන් අතර ලේබල් න්‍යාය ද වැදගත් වේ. ලේබල් න්‍යාය 1960 ගනන් වලදී ඉතා ප්‍රචලිත විය. හෝවාර්ඩ් බේකර් (Becker) කායි එරික්සන් (Erickson) ජොන් කිට්යුස් (Kituse) මෙම මතය ප්‍රචලිත කිරීමට දායකත්වය ලබා දුන්හ (රත්නපාල,1990:129).

ඈත අතීතයේ අපරාධ කිරීම හා අපරාධකරුවන් බිහිවීම සමාජ ව්‍යාධියක් ලෙස සමාජයට අනුගත කිරීමට වඩා දැඩි දඬුවම් ලබා දී සමා ජ ගෞරවය නැති කොට පළිගැනීමට සැලැස්වීම සිදු විය. වර්තමානයේ අපරාධකරුවා සිරගත කිරීමෙන් පළිගැනීමට වඩා පුනරුත්තාපනයට ලක් කොට යහපත් පුරවැසියකු බවට පත් කිරීම සිදු කළ ද ඒ මඟින් නීතිය ඉෂ්ට කිරීමට යාමේදී අපරාධකරුවාගේ පාර්ශවයට යම්කිසි හානියක් සිදු වන බව හොවාඩ් බේකර් (Howard Becker) ලේබල් න්‍යාය තුළින් පෙන්වා දී ඇත (ජයතුංග,2010:47). "අපරාධකරුවා" යන ලේබල් කිරීම අපරාධකරු පාර්ශවයට හානි සිදු කරන බව තවදුරටත් පෙන්වා දී ඇත.

යම්කිසි කණ්ඩායම් විසින් නීති සෑදීම තුළින් අපචාරයන් බිහි වන අතර එම නීති උපයෝගි කරගනිමින් සමහර පුද්ගලයන් හට ලේබල් ලබා දෙමින් ඔවුන් පිටස්තරයින් ලෙස සලකනු ලබය. මේ අනුව අපචාරය යනු පුද්ගලයා විසින් සිදු කළ ක්‍රියාවන්හි තත්ත්වය නොවේ. අනෙකුත් අය විසින් නීති රෙගුලාසි හා දඬුවම් උපයෝගි කරගෙන වරදකරුවෙකු ලෙස ලේබල් කරනු ඇත. අපරාධකාරී හැසිරීම මිනිසුන් විසින් ලේබල් ලබා දීමට ඉවහල් වූ චර්යාවකි (කරුණාතිලක,1998:46).

අපරාධකාරී හැසිරීම අධ්‍යයනයේදී ලේබල් න්‍යායේ වැදගත්කම 1951 දී රචිත සමාජ ව්‍යාධි (Social Pathology) කෘතිය වැදගත් වේ. එඩ්වින් ලෙමර්ට් (Edwin Lemert) ඉදිරිපත් කරන ලේබල් නයාය තුළ ප්‍රාථමික හා ද්විතියික වශයෙන් අපරාධකරුවා ලේබල් කිරීමට ලක් කර ඇත (ජයතුංග,2010:47).

යම් පුද්ගලයකු පළමු වරට අපරාධකාරී චර්යාවක නියැලුණු විට ඒ නිසා සමාජය ඔහු අපරාධකරුවකු ලෙස හඳුනා ගනී. අපරාධකරුවා යන ලේබල් කිරීම සමාජයෙන් ඉවත්වන්නට ද පවතින්නටද ඉඩ ඇත. නමුත් අපරාධ කිරීමට ඔහු දිගටම පෙළඹුණ හොත් සමාජය එම පුද්ගලයාට ද්විතියික ලේබල් කිරීමක් සිදු කරන අතර එමඟින් පුද්ගලයාගේ ආත්ම ගරුත්වයට හානි පමුණුවයි.

ලේබල් කිරීමේ න්‍යාය නීති කඩ කරන්නන් අධ්‍යයනය කිරීම සඳහා උපයෝගී කර ගැනීමට ක්ලැරන්ස් ස්කාර්ග් (Clarence Scharg) නම් ඇමරිකානු අපරාධ විද්‍යාඥයා ක්‍රියා කර ඇත. න්‍යාය මූලික ප්‍රස්තුත 9 ක් ඔස්සේ විග්‍රහ කර ඇත. එනම්,

- යම් ක්‍රියාවක් නිසර්ගයෙන් අපචාරී ක්‍රියාවක් බවට පත් නොවේ.
- අපරාධකාරීත්වය පිළිබඳ නිර්වචනයන් ගොඩ නැගී ඇත්තේ ප්‍රබල සමූහයන්ගේ නිල නියෝජන සහ රුචිකත්වයන් මතය. එයට පොලිසිය, අධිකරණය, පුනරුත්ථාපන ආයතන හා පරිපාලන චක්‍රයන් ආදී කණ්ඩායම් වල නියෝජනය ලැබී තිබේ.
- නීතිය කැඩීමෙන් පුද්ගලයකු අපරාධකරුවකු බවට පත් නොවේ. ඒ සඳහා සමාජ දේශපාලන වරප්‍රසාද යටතේ ඔහු දරණ තත්ත්වයන් තුළින් අපරාධකරුවෙකු ලෙස කටයුතු කිරීමට පෙළඹිය හැකිය.
- ආනුභවික වශයෙන් මෙන් ම සාමාන්‍ය දැකීම අනුව යථාර්ථයේ දී පුද්ගලයන් අපරාධකාරී නොවන වර්ගයන්ට ද බෙදේ.
- ඉතා සුළු පිරිසක් නීති කඩ කරන අය ලෙස අල්ලා ගනු ලබන අතර බොහෝ ඒවා සාමාන්‍ය වරදවල් වේ.
- නීතිය ක්‍රියාත්මක කිරීමේදී සාපරාධී ක්‍රියාව පමණක් නොව පූර්ණ ලෙස පුද්ගලයා දෙස ද අවධානය යොමු කරනු ලබන අතර දඬුවම් ලබා දීමේ දී වරදකරුවාගේ ගති ලක්ෂණ වලට අනුව ක්‍රියා කරනු ඇත.
- සාපරාධී දඬුවම් ලබා දීමේ දී වරදකරුවාගේ අනෙකුත් ලක්ෂණ කෙරෙහිද අවධානය යොමු කර ඇත. පිරිමින්, තරුණයන්, රැකියා නොමැති හෝ ස්ථිර රැකියාවක් නොමැති පුද්ගලයන්, අඩු අධ්‍යාපනයක් ලැබුවන්, පහළ පන්තිවල සාමාජිකයන්, සුළු ජාතීන්, අනිත්‍ය මෙනෙහි කරන්නන් සහ පිරිහීමට පත් නාගරික පදිංචිකරුවන් තුළ ඉතාමත් දැඩි ලෙස සහ නිතර නිතර නීතිය කඩ කිරීම් සිදු වන්නේය යන ප්‍රවනතාවයෙන් ඔවුන් දෙස අවධානය යොමු කෙරේ.
- අපරාධකරු නීචයෙක් (Pariah) ලෙස සැලකීමේ ඒකාකෘතික සංකල්පයන්ට අනුව (Steriotyped) සාපරාධී යුක්තිය පහල වී තිබේ. එසේම සාමාන්‍ය ලෙස නරක හා ප්‍රජාවගේ නොසලකා හැරීමට යෝග්‍ය වන්නා වූ පුද්ගලයන් සිතාමතා ම වැරදි කරන්නන් ලෙස සලකනු ඇත.

- යමෙකු දුෂ්ට මිනිසෙකු ලෙස මහජන තීන්දුවට සහ ලේබල් කිරීමට ලක් කරනු ලබන්නේ නම් වරදකරුවකු හට යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීමට ඔහුටම දුෂ්කර වනු ඇත (කරුණාතිලක,1998:47-49).

සමාජය විසින් ඇති කරන වෙනස හා එම පුද්ගලයා තුළ ද ඔහු නිසාම ඇති වන වෙනස වැදගත් වේ. සමාජය ලේබල් ගසන විට පුද්ගලයා ඊට වෛර කරයි. කාලයක් ගත වන විට ඔහුගේ අභ්‍යන්තරයට එම ලේබලය වැටෙනු ඇත. "මම හොරෙක් " මුළු සමාජයම හඳුන්වන්නේ එලෙසය. එහෙයින් "සොරකම් එකක් කළත්, දහයක් කළත් " එම ලේබලය වෙනස් නොවේ යැයි සිතමින් කටයුතු කිරීම එම ක්‍රියාව නැවත කිරීමට පෙළඹීමට රුකුලක් වනු ඇත (රත්නපාල,1990:131).

අපරාධකාරි චර්යාවක් යම් පුද්ගලයකු විසින් සිදු කල විට එම පුද්ගලයා සමාජය විසින් අපරාධකරුවකු ලෙස හංවඩු ගැසීම නිසා එම පුද්ගලයාට අභ්‍යන්තරීකරණය වීමෙන් දිගු කාලින වශයෙන් අපරාධකාරි චර්යාවන් සිදු කිරීමට පෙළඹීමක් සිදු විය හැක. ලේබල් න්‍යාය තුළින් අපරාධකාරි චර්යාව පිළිබඳ විග්‍රහ කිරීමේදි කෙතරම් බලපෑමක් සිදු කරන්නේ ද යන්න වැදගත් වේ.

**නිගමනය**

අපරාධකාරී චර්යාවට හේතු පාදක වන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට න්‍යායන් වැදගත් වේ. රටකින් රටකට සමාජයෙන් සමාජයට විවිධ ස්වරූපයන් නිසා න්‍යායන් භාවිතය පමණක් බලපාන්නේ නැත. අපරාධකාරී චර්යාවකට එක් සාධකයක් පමණක් බලපාන්නේ නැත. එයට බලපානු ලබන හේතු සලකා බැලීමේ දි මෙකී න්‍යායන්ගේ න්‍යායාත්මක දැනුම ඔස්සේ විවිධ ස්වරූපයන් හඳුනා ගත හැකිවේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අමරසේකර, දයා (2012), *අපරාධ විද්‍යාව*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.
කරුණාතිලක, කේ. (1990), *අපරාධ විද්‍යා ප්‍රවේශය*, මාලිංග ප්‍රකාශකයෝ, කොළඹ.
කරුණාතිලක, කේ. (1998), *අපරාධ බාලාපරාධ සහ පුනරුත්ථාපනය*, මාලිංග ප්‍රකාශකයෝ, කොළඹ.
ජයතුංග, නදීරා (2010), *ශ්‍රී ලංකාවේ අපරාධ හා එහි සමාජ සංස්කෘතික පසුබිම,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
ජයවීර, සුධීර (2008), *සමාජ විචාර ලිපි*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
ජයසිංහ, ඒ.කේ.ජී. (2013), *සමාජ විද්‍යාව මූලික සංකල්පය*, කඩුල්ල ප්‍රකාශන, කොළඹ.
පෙරේරා, ස්වර්ණලතා (2006), *සමාජ ගැටළු*, වින්දන ප්‍රකාශන, නුගේගොඩ.
රත්නපාල, නන්දසේන (1990), *අපරාධ විද්‍යාවේ මූලධර්ම*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.
හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1963), *සිංහල විශ්ව කෝෂය*, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
Scott, William P. (1988), Dictionary of Sociology, Special indian edition, New Delhi.
The Encycolopedia of Amerika (1959).
The New Encycolopedia Britanica (1976).